www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද මිලිටරිවාදය පිලිබඳ අන්‍යොන්‍ය උත්සුකතා චීනය හා ඉන්දියාව එකිනෙකාට සමීප කරවයි

## Mutual concern over US militarism brings China and India closer

කේ. රත්නායක විසිනි
2005 අප්‍රේල් 27

අප්‍රේල් 5-12 දිනවල සිදු වූ චීන අගමැති වෙන් ජියාබාඕගේ මෑත දකුනු ආසියානු සංචාරය තවමත් අවිනිශ්චිත තත්වයක පවත්නා චීනය හා ඉන්දියාව අතර සංහිඳියාවෙහි තවත් පියවරක් සලකුනු කරයි. 1962 දී යුද වැදුනු මෙම දෙරට, ස්වකීය දේශ සීමා මතභේද විසඳා ගැනීම මෙන් ම වඩා සමීප ආර්ථික සබඳතා ඇති කර ගැනීම දිශාවට ගමන් කලේ ය. පකිස්තානය, බංග්ලාදේශය හා ශ්‍රී ලංකාව යන රටවල ද සංචාරය කල වෙන්, තමන්ගේ "වැදගත් ම සංචාරය" සිදු කෙරුනේ සිය දින අටේ සංචාරයේ අවසන් සිවු දින ගත කල ඉන්දියාවට බව අවධාරනය කලේ ය.

"ඉන්දියාව සහ චීනය ඒකාබද්ධව ලෝක පර්යාය යලි හැඩ ගස්වන" බව ප්‍රකාශ කරමින් වෙන් පිලිගැනීම මගින් ඉන්දියානු අගමැති මන්මෝහන් සිං, සංචාරය සම්බන්ධයෙන් නව දිල්ලිය දක්වන උද්යෝගය කැටි කොට දක්වී ය. ඉහල පෙලේ චීන නිලධාරීන්ගෙන් හා ව්‍යාපාරික නායකයන්ගෙන් සමන්විත 100ක පමන නියෝජිත කන්ඩායමක් සමග පැමිනි වෙන්, කොංග්‍රස් පක්ෂ නායිකා සෝනියා ගාන්ධි ඇතුලු සෙසු ජ්‍යෙෂ්ඨ ඉන්දියානු දේශපාලනඥයන් ද හමු විය. සංචාරය අවසානයේ, අගමැතිවරු දෙදෙනා දෙරට අතර ගිවිසුම්, රාජ්‍ය තාන්ත්‍රික ලියවිලි සහ අවබෝධතා ගිවිසුම් 12ක් ලැයිස්තුගත කරමින් කරුනු 21කින් යුත් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කලේ ය.

දිගු කලක් තිස්සේ පවත්නා දේශ සීමා මතභේද විසඳා ගැනීම ලැයිස්තුවේ ප්‍රමුඛස්ථානයක තිබුනි. මෙම සංකීර්න ගැටලුවට ඉන්දියානු පාලනය යටතේ පවත්නා අරුනාචල් ප්‍රදේශ් සහ සිකිම් යන ප්‍රාන්ත සම්බන්ධයෙන් චීනය හිමිකම් කීම සහ එයට එදිරිව ඉන්දියාව කාශ්මීරයේ ලදාක් ප්‍රදේශයට යාබදව පිහිටි චීනයේ පාලනයට නතුව ඇති අක්සායි චින් ප්‍රදේශයට හිමිකම් කීම ද ඇතුලත් ය. දලයි ලාමා ඇතුලු ඉන්දියාව තුල පිටුවාහලේ වෙසෙන ටිබෙට් වැසියන්ගේ ක්‍රියාකාරකම් ගැන ද බෙයිජිං පාලනයට උත්සුකතා පවතී.

සංචාරය තුල දී, නායකයන් දෙපල දේශ සීමා මතභේද විසඳගැනීම සඳහා රාමුවක් තනා ගැනීමට එකඟ විය. සිකිම් ප්‍රදේශය ඉන්දියාවට අයත් බවට ඒකාබද්ධ නිවේදනයෙන් චීනය එකඟ වෙයි. ඊට හිලව් වසයෙන්, ටිබෙටය චීනයේ කොටසක් බවත් ටිබෙට් පිටුවාහලුන්ට චීන විරෝධී ක්‍රියාකාරකම්වල යෙදීමට ඉඩ නොදෙන බවත් නව දිල්ලිය යලි අවධාරනය කලේ ය. සෙසු මතභේද "මිත්‍රශීලී සාකච්ඡා" හරහා විසඳා ගැනෙනු ඇත.

ආර්ථික පෙරමුන සම්බන්ධයෙන් ගත් කල, ඒකාබද්ධ ප්‍රකාශය නිවේදනය කරන්නේ දෙරට අතර වෙලඳාම 2004 වසරේ තිබූ ඩොලර් බිලියන 13 සිට 2008 වන විට ඩොලර් බිලියන 20 දක්වා ඉහල දැමෙනු ඇති බවයි. ඒකාබද්ධ ආර්ථික කන්ඩායම්, වෙලඳාම හා ආයෝජනය දිරිගැන්වීම සඳහා යාන්ත්‍රන සහ සමීප මූල්‍ය සබඳතා ඇති කර ගැනීමටත් තොරතුරු තාක්ෂන අංශයේ සහයෝගිතාව වැඩිදියුනු කිරීමට සහ සෘජු සමුද්‍ර හා ගුවන් ප්‍රවාහන සබඳතා වැඩිදියුනු කිරීමටත් නායක දෙපල එකඟ විය.

තෙල් හා ගෑස් සම්බන්ධයෙන් කටයුතු කිරීම එක් ප්‍රධාන ක්ෂේත්‍රයකි. "බල ශක්ති ආරක්ෂාව සහ සංරක්ෂනය පිලිබඳ ක්ෂේත්‍රයේ සහයෝගීව කටයුතු කිරීමට" සහ "තෙවන රටවල ඛනිජ තෙල් හා ස්වභාවික වායු නිධි සොයාගැනීමේ හා ගවේෂන කටයුතුවල දී" ඒකාබද්ධව වැඩ කරනු පිනිස දෙරටේ ඒජන්සි දිරිගැන්වීමට දෙපාර්ශ්වය එකඟ විය. සීඝ්‍රයෙන් නැගෙන ස්වකීය බල ශක්ති ඉල්ලුම සපුරාගනු පිනිස අවශ්‍ය මූලාශ්‍ර සම්බන්ධයෙන් දෙරට ම තරඟ වදින තතු යටතේ මෙම එකඟතාව අර්ථභාරී ය.

දෙරට තුල පවත්නා දැවැන්ත ලාභ ශ්‍රම උල්පත්වල වාසිය ඩැහැ ගනු පිනිස විදේශ ප්‍රාග්ධනය ගලා ඒම හේතු කොටගෙන, පසුගිය දශකය මුලුල්ලේ ඉන්දියාව හා චීනය ඉහල මට්ටමේ ආර්ථික වර්ධනයන් අත්විඳ ඇත. චීනය "ලෝකයේ වැඩපොල" බවට පත් වූයේ යම් සේ ද, ඉන්දියාවේ ලාභ, උගත්, ඉංග්‍රීසි කතා කරන තාක්ෂනඥ, පරිගනක වැඩසටහන් සම්පාදක සහ කාර්යාල සේවක සැපයුම ගසාකමින් විදේශ ආයෝජන ගලා ඒම මගින් ඉන්දියාව "ලෝකයේ කාර්යාලය" බවට පරිවර්තනය වී ඇත.

ඉන්දියානු හා චීන පාලක ප්‍රභූ දෙපාර්ශ්වයට ම, වඩා ප්‍රමුඛ ජාත්‍යන්තර ක්‍රියාකලාපයක් ඉටු කිරීමේ අභිලාෂයන් පවතී. එම තතු වෙලඳ පොල සහ සම්පත් සඳහා පමනක් නොව ආසියානු කලාපය තුල ආනුභාවය සඳහා ද වන තරඟය තුල ඔවුන් ප්‍රතිවාදීන් බවට පත් කොට තිබේ. නිදසුනක් වසයෙන්, ඉන්දියාව හා චීනය යන දෙරට ම අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානයට (ඒසියන්) අයත් රටවල් සමග ආර්ථික හා දේශපාලන සබඳතා පුලුල් කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී. ඉන්දියාවට යාබදව පිහිටි බුරුමයේ මිලිටරි ජුන්ටාව සමග චීනයට දිගු කාලීනව සබඳතා ඇති අතර නව දිල්ලිය ද එම රට තුල සිය මැදිහත්වීම පුලුල් කර ගැනීමේ උත්සාහයක යෙදී සිටී.

කෙසේ වෙතත්, සැබෑ ප්‍රශ්නය වන්නේ, දෙරට තරඟකාරිත්වය හා ගැටුම් කරා තල්ලු කරන්නේ කුමක් විසින් ද යන්න නොව, ඔවුන් ඒකාබද්ධ කරන්නේ කුමක් විසින් ද යන්නයි. සබඳතා තවමත් අවිනිශ්චිත තත්වයක පවතින නමුත්, දශක ගනනාවක ආතති සහගත කොන්දේසිවලින් පසුව සබඳතාවන්හි කිසියම් උනුසුම් භාවයක් පෙන්නුම් කෙරේ. පුවත්පත්වලට කතා කරමින්, ඉන්දියානු විදේශ ලේකම් ශ්‍යාම් සරන් මෙසේ ප්‍රකාශ කලේය: "ඉන්දියාව හා චීනය හවුල්කරුවන් මිස ප්‍රතිවාදීන් නො වේ. අප එකිනෙකා දෙස සතුරන් ලෙස නොබලමු."

ඒකාබද්ධ නිවේදනය මීට අදාල හේතු පිලිබඳව ඉඟි කලේ ය. දෙරටට ම "නව ජාත්‍යන්තර දේශපාලන හා ආර්ථික පර්යායක් ගොඩනැගීම දිරිගැන්වීමේ ක්‍රියාදාමය තුල වැදගත් ක්‍රියාකලාපයක්" ඇති බවත් "ජාත්‍යන්තර සබඳතා ප්‍රජාතන්ත්‍රකරනය කිරීමට හා බහුපාර්ශ්වීයවාදයට දෙපාර්ශ්වය ම සහාය දෙන" බවත් එම නිවේදනය සඳහන් කරයි. "බහුපාර්ශ්වීයවාදය" සහ භූගෝලී සාමය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැදගත්කම ගැන කෙරී ඇති සඳහන් තරමක් අපැහැදිලි වන නමුත් ඒවායේ පැහැදිලි එල්ලය ඉරාකයට එරෙහිව වොෂිංටනය සිදු කල ඒකපාර්ශ්වීය හා නීති විරෝධී ආක්‍රමනයයි.

දෙරට එකමුතුවක් කරා තල්ලු කරන කේන්ද්‍රීය සාධකය නම් නිර්බාධිත එක්සත් ජනපද මිලිටරිවාදයේ ප්‍රතිවිපාක පිලිබඳව පවත්නා අන්‍යොන්‍ය උත්සුකතාව යි. චීනය සම්බන්ධයෙන් ගත හොත්, ඉන්දියාව සමග හොඳ හිත ඇති කර ගැනීමේ ප්‍රයත්නයන් වනාහි ඔවුන්ගේ භීතියට හේතු වී ඇති ඇමරිකානු වටලෑම බිඳීමේ උත්සාහයේ කොටසකි. සැප්තැම්බර් 11 දා එක්සත් ජනපදයට එල්ල වූ ප්‍රහාරයෙන් අනතුරුව, බුෂ් පාලනාධිකාරය ඇෆ්ඝනිස්තානය අල්ලාගෙන ප්‍රථම වතාවට මධ්‍යම ආසියාවේ එක්සත් ජනපද මිලිටරි කඳවුරු ඉදි කල අතර අග්නිදිග ආසියාවේ සිය මිලිටරි බලය යලි ගොඩනගා ගැනීමේ උත්සාහයක යෙදුනි. එක්තරා දුරකට චීනයට එරෙහි තවත් පියවරක් ලෙස, වොෂිංටනය නව දිල්ලිය සමග ද ආර්ථික හා මිලිටරි සබඳතා ශක්තිමත් කර ගැනීමේ යෙදී සිටී. පසුගිය පස් වසරක කාලය මුලුල්ලේ, එක්සත් ජනපද සහ ඉන්දියානු මිලිටරි හමුදා, රහස් ඔත්තු තොරතුරු බෙදාහදා ගැනීමේ මෙන් ම ඒකාබද්ධ අභ්‍යාසවල ද යෙදී ඇත. බැලිස්ටික් මිසයිලවලින් ආරක්ෂා වීමේ පද්ධතියක් පිලිබඳ එක්සත් ජනපද සැලසුම් ඇතුලු කරුනු ගනනාවක් සම්බන්ධයෙන් ඉහල පෙලේ ඨ ස්වීම් පවත්වනු ලැබ ඇත. මෙම වෙනස පෙර පැවති ශීතල යුද කාලීන සබඳතාවලින් බිඳීමක් නියෝජනය කරයි. එකල ඉන්දියාවට සෝවියට් සංගමය සමග සමීප සබඳතා තිබූ අතර ප්‍රතිවාදී පකිස්තානය එක්සත් ජනපදයේ හා චීනයේ පිටුබලය ලැබී ය. අඩු ගනනේ නව දිල්ලිය තුල එක්සත් ජනපදයේ ආනුභාවය උදාසීන කිරීමට බෙයිජිං පාලනය පැහැදිලිව ම බලාපොරොත්තු වේ.

චීනය පකිස්තානය හා බංග්ලාදේශය සමග ඇති කර ගන්නා සබඳතා එක්සත් ජනපද වටලෑමක් වලකා ගැනීමේ එල්ලයෙන් ද යුක්ත ය. බෙයිජිං පාලනය, පර්සියානු බොක්කට සමීපව මූලෝපායිකව පිහිටා ඇති පකිස්තානයේ ග්වාඩර්හි ගැඹුරු මුහුදු වරායක් ගොඩ නැගීමේ ද යෙදී සිටී. අවට සාගරය නිරීක්ෂනය කල හැකි සුපරීක්ෂ උපකරන සහිතව මෙම වරාය වැඩි දියුනු කෙරෙන අතර එය නාවික යාත්‍රා ඇතුලු චීන නෞකා සඳහා විවෘත වනු ඇත. මෙම ඉදිකිරීමට බෙයිජිං පාලනය සම්බන්ධ වීම, මැද පෙරදිගින් ලැබෙන චීනයේ තීරනාත්මක තෙල් සැපයුම් ආරක්ෂා කර ගැනීම දක්වා එහි නාවික බලයේ සීමාව පුලුල් කර ගැනීමට උදව්කාරක වනු ඇත. චීනයට චිතගොං වරායට ඇතුලු වීමේ අවස්ථාව ලබා දිය හැකි යැයි, වෙන්ගේ සංචාරය තුල දී, බංග්ලාදේශය පැවසී ය.

## ඉන්දියානු අවශ්‍යතා

චීනය සමග සබඳතා ශක්තිමත් කර ගැනීමේ ඉන්දියානු තීන්දුවට බලපෑ හේතු එතරම් පැහැදිලි නැත. එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන්. විශේෂයෙන් ම ඉන්දියාව කෙරෙහි අවධානය යොමු කරමින්, 2000 දී දකුනු ආසියාවේ සංචාරයක යෙදුනු අවස්ථාවේ පටන් නව දිල්ලිය වොෂිංටනය සමග සිය සබඳතා වර්ධනය කරගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු අවධානයක් යොදා තිබේ. මෙම සබඳතා බුෂ් පාලනාධිකාරය යටතේ, සහ විශේෂයෙන් ම 2001 සැප්තැම්බර් 11 සිද්ධියට ක්ෂනිකව ඉක්බිත්තෙහි, වඩා සමීප බවට පත් විය. එය සිය ප්‍රතිවාදී පකිස්තානය දුර්වල කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් ඉන්දියාව ඇෆ්ඝනිස්තානයේ තලිබාන් තන්ත්‍රය පෙරලා දැමීමට එක්සත් ජනපදය ගෙන ගිය වැඩපිලිවෙලට මුලුමනින් ම පිටුබලය සැපයී ය.

එහෙත් එක්සත් ජනපදය ඉන්දියාවේ ම "ත්‍රස්ත විරෝධී යුද්ධයට" -- එනම්. කාශ්මීරයේ ඉන්දියානු පාලනය අවසන් කිරීම පිනිස සටන් වදින පකිස්තානයේ පිටුබලය ලබන සන්නද්ධ සටන්කරුවන්ට විරුද්ධ යුද්ධයට -- සහාය දෙනු ඇතැයි යනුවෙන් නව දිල්ලිය කල ගනන් බැලීම් වැරදි බව ඔප්පු වී ඇත. ඉස්ලාමීය මූලධර්මවාදීන්ගේ කටයුතු පාලනය කරන ලෙස පකිස්තානයට බලපෑම් කල අතර ම, වොෂිංටනය උත්සුක වූයේ මුෂාරෆ් දිගට ම බලයේ රඳවා ගෙන තම පාර්ශ්වයෙන් තබා ගැනීමට යි. තලිබාන් තන්ත්‍රයට දුන් සිය සහයෝගය නතර කිරීමෙන් පසුව, පකිස්තානය, ඇෆ්ඝනිස්තානයේ එක්සත් ජනපද වාඩිලෑමට එරෙහි සන්නද්ධ කන්ඩායම්වලට විරුද්ධව එක්සත් ජනපදය ගෙන යන මිලිටරි ප්‍රහාරවල වැදගත් කොටස්කරුවෙක් බවට පත් විය.

2003 මාර්තු මස එක්සත් ජනපදයේ නායකත්වයෙන් යුතුව සිදු වූ ඉරාක ආක්‍රමනය එක්සත් ජනපද ඒකපාර්ශ්වීයත්වයේ අන්තරාය පිලිබඳව ඉන්දියානු පාලක කව තුල පවත්නා භීතීන්ට තෙල් වත් කලේ ය. යුද්ධය පිලිබඳ නව දිල්ලියේ විවේචන සීමිත වූ නමුත් ආන්ඩුව වාඩිලෑමට සහාය පිනිස ඉන්දියානු හමුදා යැවීම ප්‍රතික්ෂේප කලේ ය. එක්සත් ජනපද-ඉන්දියානු සබඳතා සඳහා මූලිකත්වය ගෙන තිබූ භාරතීය ජනතා පක්ෂයේ (බීජේපී) නායකත්වයෙන් යුත් ආන්ඩුව, ආක්‍රමනයෙන් අනතුරුව, පරෙස්සමින් වෙනත් දිශාවකට හැරීම ඇරඹී ය.

අගමැති අතාල් බෙහාරි වජ්පායි 2003 දී යුරෝපයට ගොස් ආක්‍රමනය පිලිබඳව විවේචනශීලී වූ ප්‍රන්සයේ හා ජර්මනියේ සංචාරයන්හි යෙදුනි. බිස්නස් ලයින් පත්‍රයට ලියමින් එක් තීරු ලිපි රචකයකු එම අවස්ථාවේ සටහන් කලේ, "ඉරාක යුද්ධයට හා යුරෝපයේ පුලුල් ආර්ථික වෙනස්කම්වලට පසුව" එලඹෙන මෙම සංචාරය "ඉන්දියාව සම්බන්ධයෙන් කාලෝචිත ද තීරනාත්මක ද වන්" බවයි.

වජ්පායි 2003 දී බෙයිජිංහි ද සංචාරයක යෙදුනි. එය වනාහි දශක ගනනාවකට පසුව ඉන්දියානු අගමැතිවරයකු එහි සිදු කල ප්‍රථම සංචාරයයි. ඊට යන්තම් වසර පහකට පෙරාතුව ඔහුගේ ආන්ඩුව ගත් ආස්ථානය හමුවේ මෙම සංචාරය විශේෂයෙන් ම සැලකිල්ලට ලක් කිරීමට වටනේ ය. 1998 දී, වජ්පායි, එක්සත් ජනපද ජනාධිපති ක්ලින්ටන් වෙත යැවූ ලිපියක, තම ආන්ඩුව න්‍යෂ්ටික අත්හදා බැලීම් සිදු කිරීමට ගත් තීන්දුව ආරක්ෂා කලේ, චීන න්‍යෂ්ටික අවි ගබඩා මගින් ඉන්දියාවට එල්ල වන තර්ජනය ගැන සඳහන් කරමිනි. ඔහුගේ ආරක්ෂක ඇමති ජෝර්ජ් ෆර්නැන්ඩස් එදෙසට තවත් පියවරක් තබමින්. චීනය "ඉන්දියාවේ නොම්මර එකේ සතුරා" යැයි ප්‍රකාශ කලේ ය.

2003 වන විට එම පූච්චානම් අතහැර දමා තිබුනි. චීනය. වජ්පායිගේ සංචාරය තුල දී, රුසියාව, චීනය හා ඉන්දියාව අතර ත්‍රිකෝනික සම්බන්ධතාවක අවකාශය මතු කලේ ය. ප්‍රෙස්ට් ට්‍රස්ට් ඔෆ් ඉන්දියා වාර්තාවක් ජ්‍යෙෂ්ඨ චීන නිලධාරියකු මෙසේ පැවසුවේ යැයි උපුටා දැක්වී ය: "ප්‍රජාතන්ත්‍රික ජාත්‍යන්තර සබඳතා දිරිගැන්වීමෙහි ලා සහ ජාත්‍යන්තර ආරක්ෂාව හා ස්ථාවරත්වය ආරක්ෂා කිරීමෙහි ලා චීනය, රුසියාව හා ඉන්දියාව බොහෝ පොදු අවශ්‍යතා බෙදා හදා ගනී. . ." වෙන්, මේ මස සිය සංචාරය තුල දී එම කාරනාව යලිත් මතු කලේ ය.

ඉන්දියානු පාලක ප්‍රභූවේ කොටස් වජ්පායිගේ මූලිකත්වයට ධනාත්මකව ප්‍රතිචාර දැක්වී ය. නව දිල්ලි හා බෙයිජිං පාලනයන්ට "ඔවුන්ගේ ඒකාබද්ධ නායකත්වය මගින්, භූගෝලීය කටයුතුවලට අවශ්‍යව පවත්නා සමබරතාව ලබා දියී හැකි යැයි, හින්දු පත්‍රය අදහස් දැක්වී ය." පූර්ව-භංගය පිලිබඳ ඇමරිකානු ධර්මය හා ඉරාකයට එරෙහි යුද්ධය මගින් දරුනු ලෙස සොලවාලනු ලැබ ඇති, ජාත්‍යන්තර සබඳතාවන්ගේ පෙර නොවූ විරූ දහනශීලීත්වයක් හමුවේ චීනය සමග සම්බන්ධතාවක් අතිශය වැදගත් යැයි එම ලිපිය තව දුරටත් පැවසී ය.

එහි ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලෙහි බලපෑම්වලට එරෙහි පුලුල් මහජන වෛරයක ප්‍රතිඵලයක් ලෙස, බීජේපී නායකත්වයෙන් යුත් ආන්ඩුව පසුගිය වසරේ මහ මැතිවරනයෙන් පරාජයට පත් විය. පශ්චාත් යුද කාල පරිච්ඡේදයේ බොහෝ කාලයක් ඉන්දියානු දේශපාලනය මත ආධිපත්‍යය දැරූ කොංග්‍රස් පක්ෂය, ඊනියා නොබැඳි ව්‍යාපාරය සමග සමීපව සම්බන්ධ වී සිටි අතර ශීතල යුද්ධය තුල දී සෝවියට් සංගමය සමග සමීප සබඳතා ඇති කර ගති. ඒ කෙසේ වෙතත්, එම පක්ෂය වජ්පායි යටතේ එක්සත් ජනපදය සමග තහවුරු කර ගැනුනු සබඳතා අඛන්ඩව පවත්වා ගෙන විත් තිබේ.

කෙසේ වෙතත්, පසුගිය මාසයේ දි, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස්ගේ නව දිල්ලි සංචාරය, එක්සත් ජනපදය ඉන්දියානු පාලක පන්තියේ අවශ්‍යතා ගැන දක්වන්නේ අඩු සැලකිල්ලක් ය යන්න පිලිබඳව ඉන්දියානු පාලක කව තුල පවත්නා උත්සුකතා යලි තහවුරු කලේ ය. ඉරානයේ සිට ගෑස් නල මාර්ගයක් ගොඩනැගීමට ඉන්දියාව හා පකිස්තානය කර ඇති යෝජනාවට බුෂ් පාලනාධිකාරය දක්වන විරුද්ධත්වය ඇය කෙලින් ම ප්‍රකාශයට පත් කලා ය. වොෂිංටනය ඉරානය මත උපරිම පීඩනය යෙදීමට උත්සාහ කලත්, නව දිල්ලිය ටෙහෙරානය සමග සම්බන්ධතා පවත්වා ගෙන යන අතර ගෑස් නල මාර්ගය සැලකිය යුතු වැදගත්කමකින් යුක්ත බව ද සලකයි.

රයිස්ට වක්‍රව එල්ල කෙරුනු අවමානයක් ලෙස, ඉන්දියානු ඛනිජ තෙල් ඇමති මනි ෂන්කර් අයියර් මැත දී නිවේදනය කලේ, "ඉරානයේ ස්වභාවික වායු බිම්වලින් ආරම්භ වී ඇෆ්ඝනිස්තානය, පකිස්තානය, ඉන්දියාව හා මියන්මාර් හරහා ගොස් නිරිතදිග චීනයේ යුන්නාන් පලාතෙන් අවසන් වන නල මාර්ගයක්" ඉදිකිරීමට තමන් චීනයට යෝජනා කර ඇති බව යි. මෙම සැලසුම ගැන සාකච්ඡා කරනු පිනිස මේ වසර තුල ම ඉදිරි කලෙක චීනයේ සංචාරයක යෙදීමට අයියර් සැලසුම් කරයි.

සත්තකින් ම, චීනය හා ඉන්දියාව අතර සබඳතා සුමට ලෙස ඉදිරියට නොයයි. දෙරට තවමත් කලාපීය ප්‍රතිවාදීන් ලෙස පවතින අතර තම තමන්ගේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා ඉදිරියට ගෙන යනු වස් එකිනෙකා යොදා ගැනීමේ උත්සාහයක යෙදී සිටී. සිය සංචාරය තුල දී, චීන අගමැති එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය සඳහා ඉන්දියාවට පවත්නා අභිලාෂයට සහයෝගය දෙන බවට කෝන්දේසි විරහිත එකඟතාවක් ප්‍රකාශයට පත් කලේ නැත. චීනයේ සන්නද්ධ හමුදාවන් නවීකරනය කිරීම සම්බන්ධයෙන් නව දිල්ලියට ඇස ගසා ගෙන සිටීමට සිදු වේ යැයි, වෙන්ගේ සංචාරය ඉස්මත්තෙහි දී, ඉන්දියානු ආරක්ෂක ඇමති ප්‍රනාබ් මුකර්ජී අනතුරු ඇඟවී ය.

චීනය හා සෙසු රටවල් දෙසට හැරීම මගින් ඉන්දියාව වොෂිංටනය මත රඳාපැවැත්ම අඩු කර ගැනීමේ උත්සාහයක දක්ෂ ලෙස යෙදෙයි. එවන් සමබර පිලිවෙතක යෙදීමෙහි ලා නව දිල්ලියට ඉඩ දීමට බුෂ් පාලනාධිකාරය සූදානම් ද යන වග වෙනත් ප්‍රශ්නයකි. වෙන්ගේ ඉන්දියානු සංචාරයට පසුව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශක රිචඩ් බව්චර්, ඉන්දියානු-චීන සබඳතා ඇමරිකාවට හානිකර වනු ඇත යන අදහස "හුදු සමපේක්ෂනයක්" ලෙස නොතකා හැරියේ ය. කෙසේ වෙතත්, තිරයට පිටුපසින්, චීනයට එරෙහිව ඉන්දියාව යොදා ගැනීමේ සිය සැලසුම් එක්තරා පසුබෑමකට මුහුන දීම සම්බන්ධයෙන් ධවල මන්දිරය එතරම් සතුටු නොවන බව සිතා ගැනීම අසීරු නැත.

© www.wsws.org